# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION


සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 943/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 05/06/2024<br>පැය 0540 |

## මාධ්‍ය නිවේදනය

**01. දේපල සොරකමකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.05.12 වන දින මුල්ලේරියාව පොලිස් වසමේ කැලණිමුල්ල ප්‍රදේශයේ පිහිටි හෝටලයක හිමිකරුගේ කාමරය තුල තිබූ මුදල් රුපියල් ලක්ෂ 94 ක් වටිනා රන් භාණ්ඩ සොරකම් කිරීමක් සම්බන්ධව මුල්ලේරියාව පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලකට අවශ්‍ය කරන සැකකරු වාද්දුව පොලිස් වසමේ මලේගම ප්‍රදේශයේ රැඳී සිටින බවට බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය වෙත තොරතුරක් මත වැටලීමක් සිදුකර සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන මාලඹේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු එම හෝටලයේ සූපවේදියෙකු වශයෙන් සේවය කර ඇති අතර, සොරකම් කරන ලද **රන් අත් පළඳනාවක්, රන් මාලයක්, උණු කරන ලද රන් කැබලි 02 ක් සහ රන් භාණ්ඩ විකුණා ලබා ගත් මුදල් රුපියල් 2,055,000/- ක්** භාරයට ගෙන වැඩිදුර විමර්ශන සඳහා මුල්ලේරියාව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත. මුල්ලේරියාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.06.04 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ කුරුඳුවත්ත පාර අසලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 50 මිලිග්‍රෑම් 200 ක් සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 350 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 35 හා 22 වයස්වල පසු වන වැලිවේරිය හා දෙහිවල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස බුද්ධි අංශය.

2024.06.04 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ දී ගල්කිස්ස කොට්ඨාස බුද්ධි අංශයේ නිලධාරීන් විසින් වැටලීම් 03 ක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 120 ක් සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 14 මිලිග්‍රෑම් 840 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 38, 40 හා 44 ක් වයස්වල පසු වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.

2024.06.04 වන දින දහවල් කාලයේ සහ සවස් කාලයේදී මොරටුව පොලිස් වසමේ පොල්වත්ත හා කොරළවැල්ල ප්‍රදේශවලදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරී විසින් වැටලීම් 02 ක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 80 ක් සහ හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 400 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 32 හා 38 ක් වයස්වල පසු වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මැණික්හින්න පොලිස් ස්ථානය.

2024.06.04 වන දින දහවල් කාලයේ මැණික්හින්න පොලිස් වසමේ වැඋඩගම වාවින්න මාර්ගයේදී මැණික්හින්න පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 110 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන කටුගස්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මැණික්හින්න පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පැලියගොඩ පොලිස් ස්ථානය.

2024.06.04 වන දින සවස් කාලයේ පැලියගොඩ පොලිස් වසමේ කළු පාලම ආසන්නයේදී පැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 715 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 45 ක් වන කැලණිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. පොලිස් නිල සුනඛ සහාය ඇතිව ගංජා සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගාල්ල වරාය පොලිස් ස්ථානය.

2024.06.04 වන දින උදෑසන කාලයේ ගාල්ල වරාය පොලිස් වසමේ දෙවට ප්‍රදේශයේදී දුරගමන් සේවා බස් රථ පරික්ෂා කිරීමේ මෙහෙයුමක් ක්‍රියාත්මක කර ඇති අතර එහිදී තණමල්විල සිට ගාල්ල දක්වා ධාවනය වූ ලංගම බස් රථයක් පරික්ෂාවට ලක් කර ඇත. බස් රථය තුල තිබූ සැක කටයුතු පාර්සලයක් පොලිස් නිල සුනඛ 1799 රූබි විසින් පරීක්ෂාවට ලක් කර එහි තිබූ **ගංජා කිලෝ ග්‍රෑම් 02 ග්‍රෑම් 40** ක් තිබී සොයා ගෙන ඇති අතර ගංජා සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු හා කොන්දොස්තර අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 39 හා 41 ක් වන ඇතිලිවැව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ගාල්ල වරාය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. නීති විරෝධී මත්පැන් සහ ගෝඩා සමඟ සැකකරුවකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් වසම.

2024.06.04 වන දින සවස් කාලයේ අතුරුගිරිය පොලිස් වසමේ වටරැක ප්‍රදේශයේදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 41**ක් **සහ මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 2846** ක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන මීගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තිරුක්කෝවිල් පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.

2024.06.04 වන දින උදෑසන කාලයේ තිරුක්කෝවිල් පොලිස් වසමේ වඩකණ්ඩම් ප්‍රදේශයේදී තිරුක්කෝවිල් පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තිරුක්කෝවිල් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන තිරුක්කෝවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තිරුක්කෝවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බක්කිඇල්ල පොලිස් ස්ථානය.

2024.06.04 වන දින සවස් කාලයේ බක්කිඇල්ල පොලිස් වසමේ රජගලතැන්න ප්‍රදේශයේදී බක්කිඇල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත

වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන රජගලතැන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බක්කිඇල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. ජීව පතරොම් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.06.04 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේදී බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මිලිමීටර් 09 වර්ගයේ ජීව පතරොම් 11 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන අඟුලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**12. පස් කන්දකට යටවීමෙන් දරුවෙකු මියයාම - කෑගල්ල පොලිස් වසම.**

2024.06.04 වන දින සවස් කාලයේ කෑගල්ල පොලිස් වසමේ කුරුදියවෙල, මංගලගම ප්‍රදේශයේදී පස් කන්දක් කඩා වැටීම හේතුවෙන් එයට යට වී කුඩා දරුවෙකු මියගොස් ඇති බවට ලද තොරතුරක් මත කෑගල්ල පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 03 ක් වූ කුරුදියවෙල, මංගලගම ප්‍රදේශයේ පදිංචි දරුවෙකි.**

මෙම දරුවා පදිංචි නිවස පිටුපස බැම්මක් ඉදිකිරීම සඳහා කැණීම් කර තිබූ කාණුවකට බැස සෙල්ලම් කරමින් සිටින අතරතුරදී ඊට ඉහළින් තිබූ පස් කණ්ඩිය කඩා වැටී එයට දරුවා යට වී ඇති බවට විමර්ශනයේදි අනාවරණ වී ඇත. කෑගල්ල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**13. වන අලියෙකු පහරදීමෙන් පුද්ගලයෙකු මියයාම - වාන්ඇල පොලිස් වසම.**

2024.06.04 වන දින උදෑසන කාලයේ වාන්ඇල පොලිස් වසමේ පන්සල්ගොඩැල්ල ප්‍රදේශයේ කැලෑවක් තුලදී වන අලියෙකු පහරදීම හේතුවෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට ලද තොරතුරක් මත වාන්ඇල පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 41 ක්වූ පන්සල්ගොඩැල්ල ප්‍රදේශයේ පදිංචි සිවිල් ආරක්ෂක බලකා සෙබළෙකි.**

මෙම සෙබලා කිරි ගවයින්ගෙන් කිරි දෙවීම සඳහා ගොස් සිටියදී මෙලෙස වන අලි ප්‍රහාරයට ලක්ව ඇති බවට විමර්ශනයේදි අනාවරණය වී ඇත. වාන්ඇල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**14. වන අලියෙකු පහරදීමෙන් පුද්ගලයෙකු මියයාම - කින්නියා පොලිස් වසම.**

2024.06.04 වන දින රාත්‍රී කාලයේ කින්නියා පොලිස් වසමේ වෙල්ලන්කුලම්, මජීඩ් නගර් ප්‍රදේශයේ වන අලියෙකු පහරදී පුද්ගලයෙකු මියගොස් ඇති බවට 119 මධ්‍යස්ථානයෙන් ලද පණිවිඩයකට අනුව කින්නියා පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 61 ක්වූ මජීඩ් නගර්, වෙල්ලන්කුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෙම මරණකරු තම ඉඩමේ වගා කටයුතු රැක බලා ගනිමින් සිටියදී, මෙලෙස වන අලි ප්‍රහාරයට ලක්ව ඇති බවට සිදු කළ විමර්ශනයේදි අනාවරණ වී ඇත. කින්නියා පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 15. දියේ ගිලී විදෙස් ජාතික යුවලක් මියයාම - කිරින්ද පොලිස් වසම.

2024.06.04 වන දින උදෑසන කාලයේ කිරින්ද පොලිස් වසමේ කිරින්ද වෙරළ තීරයේ දියනෑමට ගිය විදෙස් ජාතික කාන්තාවක් හා පිරිමි පුද්ගලයෙකු දියේ ගිලෙමින් සිටියදී ගොඩට ගෙන කිරින්ද රෝහලට ඇතුලත් කර ඇති බවටත් ලද පණිවිඩයකට අනුව කිරින්ද පොලිස් ස්ථානය විසින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

පිරිමි පුද්ගලයා රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති අතර කාන්තාව වැඩිදුර ප්‍රතිකාර සඳහා දෙබරවැව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 35 ක් පුරුෂයෙකු හා වයස අවුරුදු 33 ක් වන කාන්තාවක් වන අතර ඔවුන් ඉන්දිය ජාතිකයන් වේ.**

මියගිය යුවල අඹුසැමියන් වන අතර ඔවුන් සිය පවුලේ සාමාජිකයන් සමඟ සංචාරයක් සඳහා මෙරටට පැමිණ සිටින අතරතුර මුහුදේ දියනෑමට ගොස් සිටියදී මෙලෙස අනතුරට පත්ව ඇති බවට විමර්ශනයේදි අනාවරණය වී ඇත.

මෘත ශරීර දෙබරවැව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කිරින්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 16. දියේ ගිලී පුද්ගලයෙකු මියයම - අඟුරුවාතොට පොලිස් වසම.

2024.06.04 වන දින දහවල් කාලයේ අඟුරුවාතොට පොලිස් වසමේ මුල්කඩකන්ද ප්‍රදේශයේදී අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් පැවති ගංවතුරට හසුව පුද්ගලයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට ලද පණිවිඩයකට අනුව අඟුරුවාතොට පොලිස් ස්ථානය විසින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 72 ක් වන මුල්කඩකන්ද, බටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගල්පාත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අඟුරුවාතොට පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 17. බරපතල තුවාල කිරීමක් - වාද්දුව පොලිස් වසම.

2024.06.04 වන දින දහවල් කාලයේ වාද්දුව පොලිස් වසමේ පොතුපිටිය ප්‍රදේශයේ ඉඩමකට ඇතුළු වූ පුද්ගලයෙකු විසින් පොරවකින් සිදු කළ පහරදීමක් හේතුවෙන් පුද්ගලයෙකු බරපතල තුවාල ලබා පානදුර රෝහලට ඇතුලත් කර

ඇති බවට 119 තොරතුරු මධ්‍යස්ථානයෙන් ලද පණිවිඩයක් මත වාද්දුව පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 32 ක් වන පොතුපිටිය, වාද්දුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තුවාලකරු පියා සමඟ නිවසේ සිටින විට පොරවක් රැගෙන පැමිණි පුද්ගලයෙකු තම පියා සමඟ ආරවුලක් ඇති කර ගෙන පියාට පහරදීමට උත්සාහ කිරීමේදී එය වැළැක්වීමට යාමේදී තුවාලකරුගේ හිසට බරපතල තුවාල සිදුව ඇත.

සිද්ධියට සම්බන්ධ වන වයස අවුරුදු 65 ක් වන උතුරු තල්පිටිය, වාද්දුව ප්‍රදේශයේ පදිංචි සැකකරු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. වාද්දුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 18. මාරක රිය අනතුරක් - හබරාදූව පොලිස් වසම.

2024.06.04 වන දින දහවල් කාලයේදී හබරාදූව පොලිස් වසමේ ගාල්ල අකුරැස්ස මාර්ගයේ බෝගහගොඩ ප්‍රදේශයේදී අකුරැස්ස දෙස සිට ගාල්ල දෙසට ධාවනය වූ යතුරුපැදියක් එම දිශාවටම ගමන් කරමින් තිබූ පාපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පා පැදිකරු හා යතුරු පැදිකරු කරාපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පා පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 79 ක් වන මාගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. හබරාදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 19. මාරක රිය අනතුරක් - මාවතගම පොලිස් වසම.

2024.06.04 වන දින රාත්‍රී කාලයේදී මාවතගම පොලිස් වසමේ මහනුවර කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ 08 කණුව ප්‍රදේශයේදී මහනුවර දෙස සිට කුරුණෑගල දෙසට ධාවනය වූ ලොරි රථයක් මාර්ගය හරහා ගමන් කළ පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික පුද්ගලයා බරපතල තුවාල ලබා මාවතගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 73 ක් වන වැත්තෑව, ගලගෙදර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාවතගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරුට සම්බන්ධ ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මාවතගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 20. මාරක රිය අනතුරක් - මීගමුව පොලිස් වසම.

2024.06.04 වන දින රාත්‍රී කාලයේදී මීගමුව පොලිස් වසමේ කොළඹ පුත්තලම මාර්ගයේ කුරණ ප්‍රදේශයේදී කොළඹ දෙස සිට පුත්තලම දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් එම දිශාවටම ධාවනයවූ යතුරු පැදියක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු බරපතල තුවාල ලබා මීගමුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක් වන කටුනේරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ බස් රථය එම ස්ථානයේ දමා රියදුරු පලාගොස් ඇති අතර, රියදුරු අත්අඩංගුවටට ගැනීම සඳහා මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**